IPRC/24/17 Social Sciences and Humanities

# පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයෙහි දෛනික මත්ස්‍ය මිල හා අලෙවිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ඩබ්.පී.ඩී.සී. ගුණවර්ධන[1*]**

[1]ඉතිහාස අධ්‍යයන අංශය, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය යනු ලංකාවේ ප්‍රධානතම මත්ස්‍ය තොග අලෙවි මධ්‍යස්ථානයයි. ලංකාවේ සමස්ථ මුහුදු සීමාව ආවරණය වන ආකාරයෙන් ධීවර වරායන් 30 කින් පමණ දෛනිකව සපයනු ලබන මත්ස්‍ය අස්වැන්න මෙම වෙළඳ සංකීර්ණය කරා නිකුත් වේ. ඒ යටතේ පෙබරවාරි සිට මැයි මස අවසානය දක්වා කාලය තුළ මෙම වෙළඳ සංකීර්ණයෙහි කුඩා මත්ස්‍යයන්ගේ මිල විශාල මත්ස්‍යයන්ට සාපේක්ෂව වඩාත් ඉහළ අගයක් ගනු ලබන්නේ කුමන හේතුවක් මතද යන්න මෙහි අධ්‍යයන ගැටළුවයි. එහිදී දෛනික මත්ස්‍ය මිල වෙනස් වන්නේ කෙසේද, ඊට බලපාන හේතු හා එමගින් දෛනික මත්ස්‍ය අලෙවියට සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණයි. මෙම පර්යේෂණය ක්‍රියාත්මක වූයේ බලයා සහ ලින්නා යන මාළු දෙවර්ගයෙහි සැපයුම වෙනස් වීම මත අනෙකුත් මත්ස්‍ය වර්ගයන්හි දෛනික මිල වෙනස් වීම කෙරෙහි ඍජු බලපෑමක් සිදු කරන්නේය යන උපකල්පනය මතය. පර්යේෂණ ක්‍රමවේදයේදී 154 ක් වූ මුළු තොග අලෙවිසැල් සංඛ්‍යාවෙන් ( සංගහනය ) තෝරාගත් අලෙවිසැල් 30 නියැදියක් යටතේ දත්ත රැස් කරන ලදී. එහිදී ඍජු නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි භාවිතයෙන් ලබාගත් දත්තයන්ට අමතරව ධීවර අමාත්‍යාංශයට අනුබද්ධිතව මෙම වෙළඳ සංකීර්ණයෙහි ස්ථාපිත කර ඇති පරිපාලන කාර්යාලය හරහා දෛනිකව ඒකරාශී කරනු ලබන මත්ස්‍ය මිල ගණන්ද යොදා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේදී විස්තරාත්මක හා සංඛ්‍යානමය ක්‍රමයන් භාවිතයට ගත් අතර සංඛ්‍යානමය ක්‍රමයේදී ලබාගත් දෛනික මත්ස්‍ය මිල ගණන් Microsoft Excel මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය හරහා ලද ප්‍රතිඵල වශයෙන් දෛනික මත්ස්‍ය මිල වෙනස්වීම සහ අලෙවිය සඳහා ඉල්ලුම් සැපයුම් න්‍යාය ඍජු අන්දමින් බලපාන බවත්, මෝසම් සුළං ප්‍රවාහයෙහි වෙනස්වීම මත මත්ස්‍ය අස්වැන්නෙහි සැපයුම තීරණය වන බවත් හා මෙම වෙළඳ සංකීර්ණයෙහි වැඩිම අලෙවියක් පවතින්නේ බලයා සහ ලින්නා යන මාළු දෙවර්ගය වීමත් යන ප්‍රතිඵල හඳුනා ගත හැකි වීය. මෙම ප්‍රතිඵල ඇසුරෙන් ඉදිරිපත් කළ හැකි නිගමනය නම් වෙළඳ සංකීර්ණයෙහි දැනට පවතින ශීතාගාර පද්ධතිය වැඩි දියුණු කිරීමත් ධීවර සංස්ථාව වඩාත් සක්‍රීය මට්ටමින් මැදිහත් වී විධිමත් බෙදාහැරීමේ ජාලයක් ඇති කිරීමත් හරහා දෛනික මත්ස්‍ය මිල යම් පාලනයක් යටතට ගෙන ආ හැකි බවත්ය.

**මුඛ්‍ය පද:** දෛනික මත්ස්‍ය මිල, ධීවර කර්මාන්තය, පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය, මත්ස්‍ය අලෙවිය

*denukacharith25@gmail.com
ORCiD ID: https://orcid.org/0009-0005-7234-4827